''මාව ජන්දය දීලා පත් කළේ ඒ මිනිස්සු. ඒ මිනිස්සුන්ට විපතක් වුණාම මට බලන්න යන්න ඕනෑ. නැත්නම් මගෙන් වැඩක් නෑ'' යනුවෙන් ප්‍රකාශ කරමින් ජනාධිපතිවරයා එම ස්ථානයට ගියේ ය.

සහභාගි වූහ.
රජයේ ඔත්තු අංශ ප්‍රකාශ කරන ආකාරයට ජේසාලේ දේවස්ථානය තුළ සාමාන්‍ය වැසියන් 2000 ක් පමණ ලැගුම් ගෙන සිට ඇත. ඔවුන් ඉලක්ක කරගෙන එයට ප්‍රහාර එල්ල කර ඇත්තේ නාවික හමුදා ඇඳුම්වලින් සැරසුණු කොටි පිරිසක් විසිනි. කැබිතිගොල්ලෑවේ ඝාතනයෙන් කොටින්ට එල්ල වූ ජාත්‍යන්තර අපවාදය ඉතාම විශාල ය. එය වෙනතකට යොමු කිරීම උදෙසා කොටින් විසින්ම නාවික භටයන් ලෙස සැරසී දේවස්ථානයට ප්‍රහාරයක් එල්ල කර මහා මිනිස් ඝාතනයක් සිදු කර එය නාවික හමුදාව මත පැටවීමට උත්සාහ කර ඇත. එමගින් කොටින්ගේ අභිප්‍රාය වී ඇත්තේ කැබිතිගොල්ලෑවේ ප්‍රහාරයට පලිගැනීමක් වශයෙන් රජය සේසාලේ ශාන්ත මරියා දේවස්ථානයට ප්‍රහාරයක් එල්ල කර අහිංසක වැසියන් බිලිගත් බවට ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරයක් දියත් කර විශාල වාසියක් ලබා ගැනීමටය. නමුත් එය කොටින් බලාපොරොත්තු වූ තරම් සාර්ථක කර ගැනීමට හැකියාව ලැබුණේ නැත.

කැබිතිගොල්ලෑව ප්‍රහාරය සැල වූ සැණින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එය සියැසින් දැක බලා ගැනීම උදෙසා එම ස්ථානයට ගියේ ආරක්ෂක උපදේශකයන්ගේ පවා උපදෙස් නොතකමිනි. ''මාව ජන්දය දීලා පත් කළේ ඒ මිනිස්සු. ඒ මිනිස්සුන්ට විපතක් වුණාම මට බලන්න යන්න ඕනෑ. නැත්නම් මගෙන් වැඩක් නෑ'' යනුවෙන් ප්‍රකාශ කරමින් ජනාධිපතිවරයා එම ස්ථානයට ගියේ ය.
ජනාධිපතිවරයා දුටු සැණින් විපතට පත් එම ජනතාව ජනාධිපතිවරයාව වටකරගෙන විලාප දෙමින් ඉල්ලා සිටියේ තමන්ගේත් ගම්බිම්වලත් ආරක්ෂාව තහවුරු කර දෙන ලෙස ය. පළාතේ සිටින ඇතැම් ආරක්ෂක අංශ නිලධාරීන් පිළිබඳ තමන්ට විශ්වාසයක් නැති බව ප්‍රකාශ කළ එම ගම්වැසියෝ ඉල්ලා සිටියේ තමන්ට වැඩක් ඇති, ජනතාවට සමීප පොලිස් නිලධාරීන් දෙදෙනෙකු වන සහකාර පොලිස් අධිකාරි ලයනල් ගුණතිලක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයලත් බලගල්ල යන දෙදෙනාව තම ප්‍රදේශයට ලබාදෙන ලෙස ය.
එම පොලිස් නිලධාරීන් දෙදෙනා මීට වසර 6-7 කට පෙර කැබිතිගොල්ලෑව පොලිසියේ සේවය කර ඇත. ඔවුන් එහිදී නිතර දෙවේලේ අවට ගම්මානවල සැරිසරමින් කොට තර්ජනවලින් මහජනතාව ආරක්ෂා කිරීම උදෙසා උපරිම පියවර ගෙන ඇත. එපමණක් නොව, ඔවුන් දෙදෙනා මහජනතාවගේ අවශ්‍යතා සොයා බලමින් ඔවුන් සමග ඉතාමත් කිට්ටුව ආශ්‍රය කරමින් ගමේ ජනතාව සහ පොලිසිය අතර හොඳ හිත වර්ධනය කරමින් ත්‍රස්තවාදී තර්ජන වලින් ප්‍රදේශය බේරා ගැනීම සඳහා උපරිම ශක්තිය ගෙන ක්‍රියා කර ඇත. එබැවින් ඔවුන් එහි සේවය කළ කාල පරිච්ඡේදය තුළ කිසිදු ත්‍රස්තවාදී ප්‍රහාරයක් එම ප්‍රදේශයට එල්ල වී නැත. නමුත් ඔවුන් කැබිතිගොල්ලෑවෙන් මාරු කර යැවීමත්, සමග ප්‍රදේශයේ ජනතාවට යළිත් තර්ජන ගර්ජනවලට මුහුණදීමට සිදු වූයේ ඊට පසු පැමිණි ඇතැම් පොලිස් නිලධාරීන් ගෙන් ජනතාවට කිසි සේවයක් ඉටු නොවුණ බැවිනි. ''විපතට පත් ජනතාවක් තමන්ගේ ආරක්ෂාවට අසවල් පොලිස් නිලධාරීන්ව ගෙනත් දෙන්න'' යනුවෙන් ජනාධිපතිවරයා ගෙන් ඉල්ලූ ප්‍රථම අවස්ථාව මෙය වනවා ඇත. මෙය ජනාධිපතිවරයාට අදහා ගත නොහැකි අමුතු අත්දැකීමක් විය. ජනාධිපතිවරයා වහාම ජනතාවගේ හඬට කන් දෙමින් හැකි ඉක්මනින් එම පොලිස් නිලධාරීන් දෙදෙනාව කැබිතිගොල්ලෑවට එවන ලෙස පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතාට නියෝග කළේ ය. ඒ වනවිට සහකාර පොලිස් අධිකාරි ලයනල් ගුණතිලක මහතා සේවය කළේ සබරගමුව පළාත් භාර විශේෂ අපරාධ මෙහෙයුම් ඒකකය භාරව රත්නපුරයේ ය. ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයලත් බලගල්ල මහතා ගාල්ල මූලස්ථාන පොලිස් ස්ථානාධිපතිවරයා ලෙස සේවය කළේ ය. කැබිතිගොල්ලෑවට ප්‍රහාරය එල්ල වූ ජූනි මස 15 වැනි දා රාත්‍රී 10.30 ට පමණ උතුරුමැද පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති කිංස්ලි ඒකනායක මහතාගෙන් ලයනල් ගුණතිලක මහතාට හදිසි පණිවුඩයක් ලැබිණි. ඉන් ප්‍රකාශ වුණේ ජනාධිපතිවරයාගේ ඉල්ලීමක් පරිදි වහාම කැබිතිගොල්ලෑවේ ආරක්ෂාවට පැමිණෙන ලෙස ය. ප්‍රධාන පොලිස් පරීක්ෂක බලගල්ල මහතාට ද එම පණිවුඩය ලැබිණි. ඔවුන් දෙදෙනා එදිනම රාත්‍රී ජීප් රථයෙන් කැබිතිගොල්ලෑව බලා පැමිනිය හ. ඔවුන් දුටු සැණින් ප්‍රදේශයේ ජනතාව ඔවුන්ව බදාගෙන සිය සතුට ප්‍රකාශ කරමින් කියා සිටියේ ''අපිව ආරක්ෂා කිරීම උදෙසා බුදු මහත්වරුන් දෙදෙනා පැමිණ ඇති බව'' ය.
හල්මිල්ලෑව විහාරස්ථානයේ ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ සහකාර පොලිස් අධිකාරි වරයාව බදාගෙන හැඬුවේ අවට රැස්ව සිටි ජනතාවගේ දස්වලට ද කඳුළු එක් කරවමිනි. එම පොලිස් නිලධාරීන් යළිත් කැබිතිගොල්ලෑව ට පැමිණීම එතරම්ම ජනතාවට හැඟීම් දනවන දෙයක් විය. නමුත් ජනාධිපතිවරයා හෝ ජනතාව බලාපොරොත්තු වූ ආරක්ෂමය ස්වභාවය කැබිතිගොල්ලෑවේ ඇති කිරීමට එම පොලිස් නිලධාරීන් දෙදෙනාට මේ වනතුරුත් හැකියාව ලැබී නැත. ඊට හේතු වී ඇත්තේ ඔවුන් දෙදෙනා පැමිණ දැනට සතියකට වැඩි කාලයක් ගත වී ඇතත්, මෙනෙක් නිශ්චිත රාජකාරියක් නොපැවරීම ය. අඩු තරමින් රාජකාරි දුරකථනයක් හෝ රාජකාරි කිරීමට කාර්යාලයක් හෝ නවාතැන් ගැනීමට ස්ථානයක්වත් ලබාදීමට පොලිස් ප්‍රධානීන් පියවර ගෙන නැත.
සහකාර පොලිස් අධිකාරිවරයා මේ වනවිට නවාතැන් ගෙන සිටින්නේ හොරොව්පතාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක උපාලි නාරම්පනාව මහතාගේ නිල නිවසේ ය. පොලිස් අධිකාරිවරයා තමන්ට කැබිතිගොල්ලෑවේ ආරක්ෂාව සහතික කිරීම උදෙසා වැඩ කොටසක් ලබා දෙන ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සිරිසේන හේරත් සහ නියෝජ්‍ය පොලිස්පති කිංස්ලි ඒකනායක මහතාගෙන් ඉල්ලීම් කර ඇතත්, එය මෙතෙක් ඉටු වී නැත. එම පොලිස් නිලධාරීන් දෙදෙනාව කැබිතිගොල්ලෑවට ගෙන්වූයේ ජනාධිපතිවරයාගේ උපදෙස් පිට ප්‍රදේශයේ ආරක්ෂාව සහතික කිරීමට ය. නමුත් මේ වනවිට ජනාධිපතිවරයාගේ පවා නියෝග නොතකමින් එම පොලිස් නිලධාරීන්ට වැඩ නොපැවරීම පිළිබඳ ප්‍රදේශවාසී ජනතාව බලවත් කලකිරීමට ලක් වී ඇත. මේ තත්ත්වය මත ප්‍රදේශයේ ආරක්ෂාව යළිත් තර්ජනයට ලක් වී ඇති බව ඔවුහු කියති.

මෙම අයහපත් වාතාවරණය මැද කොළඹ වරායට ප්‍රහාර එල්ල කිරීමේ තවත් කොටි සැලසුමක් පසුගිය දා අසාර්ථක විය. ඒ පසුගිය ජූනි මස 17 වැනි දාය. එදින අලුයම කල්පිටිය හරහා මුහුදු කොටි බලකායේ සිව් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පුපුරණ ද්‍රව්‍ය පටවාගත් අධිවේගී බෝට්ටුවකින් පැමිණ ඇත. ඔවුන්ගේ මූලික ඉලක්කය වී ඇත්තේ කොළඹ මෝදර රංගල නාවික හමුදා කඳවුරු තටාකාංගනයේ නවතා තිබූ සාගර සහ සයුර නැව් දෙක ය. සයුර නැව එ.ජා.ප. ආණ්ඩුවේ හිටපු අමතිවරයකු වූ මිලින්ද මොරගොඩ මහතාගේ මැදිහත්වීමෙන් ඇමරිකාවෙන් ලැබුණු එකකි. සාගර ඉන්දියාවෙන් ලැබුණු එකකි. මෙම නැව් දෙකේන් බෝම්බ අටවා පුපුරුවා හැර මහා විනාශයක් කිරීම කොටින්ගේ උපාය මාර්ගය විය. ඒ සඳහා පුපුරණ ද්‍රව්‍ය පටවාගත් බෝට්ටු කොටි සිව්දෙනා සමග කොළඹ වරාය දෙසට ඒමට උත්සාහ කර ඇතත්, එය සාර්ථක වී නැත. මුහුදේ තිබූ රළු ගතිය නිසා එය ව්‍යාර්ථ විය. පසුව කිමිඳුම් කටිටල ඇඳගත් මුහුදු කොටි තිදෙනෙක් බෝම්බත් රැගෙන මුහුදෙන් පීනා ගොස් නැව්වල බෝම්බ සවි කිරීමට ප්‍රයත්න දරා ඇත. එයත් අසාර්ථක වී තිබේ. එයට හේතු වී ඇත්තේ මුහුදු රළු ගතිය නිසා පීනා යෑමට අපහසු වීම ය. පසුව ඔවුන් බෝම්බ අතහැර ජීවිත ආරක්ෂාව පතා ගොඩබිමට පීනා ඒමට පියවර ගෙන තිබේ. ඔවුන් එලෙස පීනාගෙන පැමිණ ඇත්තේ ජා-ඇල පමුණුගම මුහුදු වෙරළට ය. එහි සිටි ධීවරයෙක් මෙම සැක කටයුතු පුද්ගලයන්ව දැක පමුණුගම පොලිසියට දැනුම් දී ඇත.
පොලිසිය පැමිණ ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට උත්සාහ කිරීමේ දී කොටි සඟවා ගෙන සිටි සයනයිඩ් කරල් කටේ දමාගෙන සියදිවි නසා ගැනීමට උත්සාහ කර ඇත. නමුත් පොලිසිය එකතු වී එය ව්‍යාර්ථ කිරීමට ප්‍රයත්න දරා තිබේ. එහෙත් එය සාර්ථක වී නැත. සයනයිඩ් කන ලද කොටි දෙදෙනාව රාගම රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර කර ජීවිත බේරාගෙන තිබේ. ඔවුන්ව අත්අඩංගුවට ගෙන සුළු වේලාවකින් පමුණුගම මුහුදේ දී මුළු පළාතම දෙදරුම් කවමින් බෝම්බ දෙකක් පුපුරා ගොස් ඇත. එකක් පෙරවරු 7.00 ට සහ අනෙක පෙරවරු 7.15 ට යනාදී ආකාරයට ඒවා පුපුරා ගොස් තිබේ. එම පුපුරා ගිය ''ලිම්පන්ටයින්'' නමින් හඳුන්වන බෝම්බ ''ටයිම්'' එකට පුපුරා යන ලෙස සකස් කර ඇත. නැව්වලට ඒවා නියමිත වේලාවට පෙර සවිකර ආපසු පැමිණ බෝට්ටුවෙන් පලායෑම කොටින්ගේ ප්‍රයත්නය වී ඇත. නමුත් මුහුදේ රළුගතිය නිසා ඒවා සියල්ල අසාර්ථක වී ඇත. මුහුදට බැස්ස කොටි පැමිණෙනතුරු බෝට්ටුව මුහුද මැද තබාගෙන එහි තවත් මුහුදු කොටියෙක් සිට ඇත. ඔහු විජේකුමාර්ය. සිය සගයන් නොපැමිණීම හා මුහුදේ බෝම්බ දෙකක් පුපුරා ගිය බව දුටු ඔහු කලබලයට පත් වී ආපසු බෝට්ටුවෙන් කල්පිටිය බලා යෑමට යාත්‍රාව දියත් කර ඇත. නමුත් ඔහුට යෑමට හැකි වී ඇත්තේ ටික දුරකි. බෝට්ටුවේ ඉන්ධන අවසන් වී තිබේ. විජේකුමාර් කිමිඳුම් කටිටල පැළඳගෙන ගොඩබිමට පැමිණ ඇත්තේ ඉන්ධන ලබා ගෙන යළි දිඹඋ යෑමේ අපේක්ෂාවෙනි. ඔහු වෙරළේ සිටි අයකුට රුසියල් 1000 ක මුදල ක් ලබා දී ඉන්ධන රැගෙන එන ලෙස ප්‍රකාශ කර ඇත. ඔහු මේ බව හෙමින් සීරුවේ වෙන්න ප්ප්‍රව පොලිසියට දැනුම් දී ඇත. පොලිසිය පැමිණ ඔහු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කළ අතර පසුව ඔහු පැමිණි බෝට්ටුව ද නාවික හමුදාව මගින් අත්අඩංගුවට ගන්නා ලදී. එහි ඩෙටනේටර්, පුපුරණ ද්‍රව්‍ය හා අත්බෝම්බයක් තිබී ඇත. කිසියම් අයෙක් අත්බෝම්බය ගැනීමට උත්සාහ කළහොත්, මුළු බෝට්ටුවම පුපුරා යන ලෙස එය සකස් කර තිබිණි. පමුණුගම දී හා තලවිල දී අත්අඩංගුවට ගත් මුහුදු කොටි බලකායේ විජේකුමාර්, ආදීමන්, උයිමාරන් සහ පොලිවුරන් යන සිව්දෙනා ගෙන ගොස් පොලිසිය ප්‍රශ්න කිරීම ආරම්භ කරන ලදී. එහි දී ඔවුන්ගෙන් බොහෝ තොරතුරු හෙළිදරව් විය. කොටින්ට මීගමුවේ සිංහල ජාතිකයින් 11 දෙනෙක් පැමිණ උදව් කර ඇත. ඉන් 06 දෙනෙක් දැනටමත් රහස් පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත. කොටින්ට වැඩි වශයෙන් උපකාර කර ඇත්තේ මීගමුව වැල්ලවීදියේ පදිංචි ''කොටි ක්‍රිස්ටි ය.'' සිංහල ජාතිකයෙකු වන ඔහුගේ නියම නම ක්‍රිස්ටි ය. ඔහු දෙමළ ජාතිකයින් වැඩිපුර අසුරු කරන නිසා බොහෝදෙනා ''කොටි ක්‍රිස්ටි'' යනුවෙන් හැඳින්වීමට පටන් ගෙන ඇත.
කිළිනොච්චිය, මුලතිව්, මන්නාරම ඇතුළු කොටි අඩවිවල නිතර දෙවේලේ සැරිසරන ඔහු ධීවරයෙකි. කොටි සමග ඉතා කිට්ටුවෙන් සම්බන්ධකම් පවත්වන ''කොටි ක්‍රිස්ටි'' ට ට්‍රෝලර් යාත්‍රාවක් මිල දී ගැනීම සඳහා කොටි මීට මසකට පමණ පෙර රුපියල් ලක්ෂ 20 ක් ලබා දී ඇත. ඔහු එම මුදල්වලින් මීගමුව කුට්ටිදුවේ පදිංචි ''රාජා'' නමැති අයගෙන් යාත්‍රාවක් මිල දී ගෙන අලුත්වැඩියා කර කොටි ප්‍රහාරයකට රැගෙන යෑමට මීගමුව කලපුවේ අසාමාන්‍ය ස්ථානයක සඟවා තිබිය දී විශේෂ කාර්ය බලකාය මගින් 19 වැනිදා සොයාගෙන ඇත.
කොටි ක්‍රිස්ටිගේ මාමා වන ''මුදියන්සේ'' නමැත්තා මන්නාරම මුරුක්කන් සිට කොටින්ව නිතරම විවිධ ප්‍රහාරක කටයුතු සඳහා මීගමුවට රැගෙන විත් ඇත. මීගමුව, මැන්සන් පෙදෙසේ, නිවසක් පරිසමා කිරීමේ දී තවත් කොටි සැලසුමක තොරතුරු හෙළි වී ඇත. එහි තිබී අශ්වබල 75 සහ 95 බෝට්ටු එන්ජින්, දුර දක්නා, මාලිමා යන්තු, අත්බෝම්බ හා තවත් භාණ්ඩ තොගයක් හමු වී ඇත. අශ්වබල 75 තරම් අධිබලැත්ත බෝට්ටු එන්ජින් පිටරටින් ගෙන ඒම උදෙසා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරය තිබිය යුතු නමුත් ඔහුට එවැනි අවසරයක් තිබී නැත. ''නිකලස්'' යන සිංහල නමින් පෙනී සිටින ඔහු දෙමළ ජාතිකයෙකි. මාවනැල්ලේ පදිංචි ''නිල්මිණි'' යන නමින් හැඳින්වෙන තරුණියක් සමග විවාහ වී සිටින ඔහුට වයස අවුරුදු 1 1/2 ක පමණ දියණියක් ද සිටින්නී ය. අයගේ මාමා කෙනෙකු කොළඹ රේගුවේ සේවය කරයි. ඒ හරහා මෙම අධිබලැත්ත එන්ජින් පිටරටින් රැගෙන එන්නට ඇති බව පොලිසිය සැක කරයි.
ඔහුගේ නිවසේ තිබී සොයාගත් නීති විරෝධී භාණ්ඩ සමග ඔහුව ද මීගමුව විශේෂ කොටිධාශ අපරාධ මෙහෙයුම් ඒකකය මගින් අත්අඩංගුවට ගෙන ඇත. නමුත් පසුව ඔහුව පොලිස් ඇප මත නිදහස් කර යවා ඇත. එතරම් භාණ්ඩ තොගයක් සොයා ගෙනත්, පොලිසිය ඔහුව නිදහස් කළේ ඇයි ද? යන ප්‍රශ්නය මතුවේ.
මෙය කිසියම් මුදල් ගනුදෙනුවක් මත සිදු වූ දෙයක් බවට සැක කෙරේ. මේ නිසා ඔහුව පොලිසිය යළිත් අත්අඩංගුවට ගත් අතර මෙහෙයුම් ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ධර්මදාස මහගමගේ මහතා ඉන් මාරු කර යවා ඇත.
''නිකලස්'' නමැති පුද්ගලයා කොටි සමග සබඳතා පවත්වා ඇත්තේ ''සීවා'' නමැති මධකලපුවේ පදිංචිකරුවකුගේ මාර්ගයෙනි. ඔහු සිංගප්පූරුවේ හා ලංකාව අතර රත්රන් ජාවාරමක පවා නියැළී සිට ඇත. නිතර දෙවේලේ ජංගම දුරකථන වලින් නිකලස් මීගමුවේ ''කැටවරන් හෝටලය'' පිටුපස සිට විවිධ පුද්ගලයන්ට දුරකථන ඇමතුම් පවා ලබාගෙන ඇත. මීගමුව දෙහිමල්වත්තේ පදිංචි ''පාරක්'' නමැති පුද්ගලයා සමග ත්‍රිරෝද රථවලින් විවිධ සැක කටයුතු පුද්ගලයන් පවා හමුවීමට ''නිකලස්'' ගොස් ඇත. ඔහු මැන්සන් පෙදෙස නිවස මිල දී ගෙන ඇත්තේ මීට වසර හයකට පමණ පෙර ය. එයට කොටින් ගෙන් මුදල් ලබුණේ ද යන්න සොයා බැලීම උදෙසා දැන් පරීක්ෂණ ආරම්භ කර ඇත.
මීගමුවේ ඇතැම් පොලිස් නිලධාරීන් ඔහු සමග නිතර සම්බන්ධතා පවත්වා ඇත. එම සබඳතා උපයෝගී කරගෙන ඔහු පරීක්ෂණවලින් බේරීමට ප්‍රයත්න දරන බව කියයි. ඔහු අත්අඩංගුවට පත් පළමු අවස්ථාවේ නිදහස් වී ඇත්තේත්, ඒ ආකාරයට ය. යළිත් එවැනි ස්වභාවයක් ඉස්මතුවීමේ තත්ත්වයක් ඇති බව පොලිසියේ ඇතැම් අය පවසති.

මහින්ද
ගිණි කන්දක් මත